# වන විද්‍යාත්මක සංරක්ෂණය හා සංවර්ධනය පිළිබඳ සිතුවිලි සමහරක්

**එල්. සී. ඒ. ද එස්. විජේසිංහ**

නියෝජ්‍ය ලේකම් ජනරාල්, ශ්‍රී ලංකා ජාතික විද්‍යා සභාව.

ලොව පුරා ස්වාභාවික කැලෑ සීඝ්‍රයෙන් එළි කිරීමත් සමගම, සීමාරහිතව කැලෑ කපා දැමීම පිළිබඳව දැඩි විරෝධය දක්වූ හසල දැනුමැති පුද්ගල සමූහයක් බිහිවීමද සිදුවී ඇත. ස්වාභාවික පරිසර පද්ධතීන් විනාශකර දැමීමෙන් අහිතකරවූ හා නියත දේශගුණික වෙනසියාවන් ඇතිවීම, අපමණ ප්‍රවේණි විද්‍යාත්මක (සත්ව හා ශාක) ද්‍රව්‍ය අහිමිවීම, කාන්තාර ඇතිවීම බඳුවූ ව්‍යසනයන් පෘතුවි ගෝලයෙහි උද්ගතවිය හැකි බව අද බොහෝ සේ පිළිගනු ලැබ ඇති මතයකි. පාංශු ඛාදනය, ප්‍රදේශයේ ජල මට්ටම විපරීතවීම හා ස්ථානික දේශගුණික වෙනසියාවන් ඇතිවීමද ස්ථානීය ලෙස හැඳින්විය හැකි අනිකුත් විනාශකාරී ආදීනව වේ. දැව ගබඩාවක් හා සංවර්ධනය සඳහා උපයෝජනය කොට ගත හැකි බිම් ප්‍රදේශ වශයෙන්ද සලකනු ලැබූ කැලෑ අද පරිසරය සුරැකීමෙහිලා ඉටු කරන කාර්යභාරයෙහි නිසග අගය හේතුකොටගෙන වැදගත් කමකින් යුතුව සලකනු ලැබේ. සුරැකුම් කාර්යය ඉටුකිරීම සඳහා කැලෑ සංරක්ෂණය කලයුතුවන අතර අද ලොව වැදගත් වෙළඳ ද්‍රව්‍යයක් වන දැව නිශ්පාදනය සඳහා කැලෑ කපා හෙළීමද කලයුතුව ඇත. විශේෂයෙන්ම සංවර්ධනය වන රටක වනපාලකයෙකුට මුහුණ දීමට සිදුවී ඇති විශාලතම ප්‍රශ්නයක් නම් එකිනෙකට ප්‍රතිවිරුද්ධවූ මෙම අවශ්‍යතාවයන් දෙක අතර සාම්‍යයකට එළඹීමයි.

**ශ්‍රී ලංකාවේ ප්‍රධාන පරිසර පද්ධතීන් :**

ශ්‍රී ලංකාව ආශ්‍රයෙන් පරිසරය සුරැකුම හා දැව සැපයුම පිළිබඳ සංකල්ප දෙක විමසුමට ලක් කිරීමට මත්තෙන්, දිවයිනේ ප්‍රධාන පරිසර පද්ධතීන් පිළිබඳව ලුහුඬු හැඳින්වීමක් කිරීම අවශ්‍යය. ශ්‍රී ලංකාව කුඩා රටක් වුවද, එහි ජෛව දේශගුණික කලාප ගණනාවක්ම ඇති අතර, මෙම කලාපවලට අනුකූලවූ විවිධ ස්වාභාවික උත්කර්ෂ පරිසර පද්ධතීන් ඇත. අවුරුදු මුළුල්ලේ ඉහල උෂ්ණත්වයක් හා අධික වූ හා මනාසේ ව්‍යාප්ත වූ වර්ෂාපතනයක් ද එයට ම ආවේණික වූ තෙත් කලාපීය පහත හා මැදරට උත්කර්ෂ පරිසර පද්ධතිය නිවර්තන වර්ෂා වනාන්තර හෝ වැසි සහිත සදහරිත වනාන්තර වලින් සමන්විත වේ. අතිවිශාල ප්‍රදේශයක පැතිර පැවති මෙම වර්ෂා වනාන්තර අක්කර 30 ලක්ෂයක් පමණ වූ බිම් ප්‍රදේශයක අක්කර 250,000 ක් දක්වා අඩුවී ඇත.

දිවයිනේ මුළු බිම් ප්‍රදේශයෙන් අටෙන් පහක් පමණ වූ කොටසක පැතිර පවත්නාවූ වියලි කලාපයේ පුළුල්වූ අතිවිශාල අඩතැන්නෙහි ස්වාභාවික උත්කර්ෂ පරිසර පද්ධතිය වියළි මිශ්‍රිත සදහරිත වනාන්තර වේ. වියළිකලාපයේ ඇතැම් කොටස්වල විශේෂයෙන් බිබිලේ, එකිරියන් කුඹුර හා අම්පාරේ අරළු, බුළු, නෙල්ලි කහට ආදී නොදැවෙන ගස්වර්ග හා දැවෙන සුළු ඉළුක් තණ වැවුනු යටි ගොන්නකින්ද යුතු සැවනා වෘක්ෂලතාදිය වැවී ඇත. වියළි මිශ්‍රිත සදහරිත වනාන්තර නැවුම් වනාන්තර නොවේ. ශතවර්ෂ ගණනාවක් මුළුල්ලේ වියලිකලාපයේ සෑම පෙදෙසක්ම යම් කලකදී ගොවිතැන් කරනු ලැබූ බැවින්, අනතුරුව පැනනැගී ඇති වියලි මිශ්‍රිත සදහරිත වනාන්තර එකී වගාවන් අත්හල පසු ස්වාභාවිකව ප්‍රවර්ධනය වූ ඒවා වේ.

මෙම ශතවර්ෂය ආරම්භයේදී වියළි කලාපය වනාන්තර වලින් ගැවසියේය. දේශීය අවශ්‍යතා හා අපනයනය සඳහා දැව ලබාගනු පිණිස බුරුත හල්මිල්ල ආදී වඩා උසස් වර්ගයේ ගස් කැපීම කරගෙන යන ලදී. පසුගිය දශක කිහිපය ඇතුලතදී තෝරාගත් ගස්හෙළීම වඩා තීව්‍ර කරන ලද අතර, සලගොවිතැන හා ජනාවාස හා කෘෂිකාර්මික සංවර්ධන ව්‍යාපෘති සඳහාද ඉඩම් එළි පෙහෙලි කිරීම වැඩිවී ඇත. මෙම කටයුතු වලින් වියලිකලාපීය වනාන්තර බෙහෙවින් වැනසී ඇති අතර, මෙහි උසස් වර්ගයේ ස්වාභාවික වන ප්‍රදේශය අක්කර දශ ලක්ෂයක් පමණවත් වේද යන්න සැක සහිතය. පහත් වර්ගයේ වන ප්‍රදේශ, ලඳු කැලෑ හා අත්හල හේන් ප්‍රදේශ, උසස් වර්ගයේ වනාන්තරවල බිම්ප්‍රමාණයෙන් දෙගුණයකටත් වඩා අධිකය. මූලික වන පරිසර පද්ධතිය අවක්‍රමණය වීම හා ලඳු කැලෑ ආදිය පැනනැගීමට මිනිස් පහස සහේතුක වී ඇත.

තෙත් කලාපීය උස්බිම් වල, උසස් වර්ගීය වනාන්තරවල උත්කර්ෂ පරිසර පද්ධතිය, සාපේක්ෂව බලන කල වඩාත් විශාල ප්‍රදේශයක සුරක්ෂිතව පවතී. විශේෂයෙන්ම පිදුරුතලාගල, සිරිපා අඩවිය, අග්‍ර බෝපතලාව සහ කික්ළියමාන ආරක්ෂිත කැලය මීට නිදසුන් වේ. මෙබඳු කැලය ආරක්ෂාවීමට ප්‍රධාන වශයෙන් හේතුවී ඇත්තේ, අඩි 5,000 කට වඩා උසින් පිහිටි කිසිදු කැලෑවක් එළි නොකල යුතු බවට 1850 හිදී පනවනු ලැබූ ආඥාවකි. රටේ උස්ම භූමි භාගයන්හි පිහිටි මෙම කැලෑ අපගේ ප්‍රධාන ගංගාවන්හි දියබෙත්ම ආරක්ෂා කිරීමෙහිලා අතිශයින් වැදගත්වේ.

ශ්‍රී ලංකාවේ ප්‍රධාන පරිසර පද්ධතීන් තුනක් පිළිබඳව ඉහතින් සඳහන් කරන ලදී. මෙබඳුවූ ස්වාභාවික උත්කර්ෂ පරිසර පද්ධතීන් මගින් පරිසරයේ ස්ථායීතාවය පවත්වාගෙන යාමෙහිලා වැදගත් කාර්ය භාරයක් ඉටුවේ. ජෛව සමුදය, භෞම සාධක හා දේශගුණය අතර සංතුලිත අන්‍යෝන්‍ය කාරක භාවය මෙම පරිසර පද්ධතීන්ගෙන් පිළිබිඹු කෙරේ. ස්වාභාවික ව්‍යසනයන් හේතු කොටගෙන මෙම පද්ධතීන් භේදනය වුවද, අවුරුදු කිහිපයක් ඇතුලතදී යලි සමතුලිත භාවය පහලවනු ඇත. සංවර්ධනය අරභයා විශාල පරිමාණයකින් වනාන්තර එළිපෙහෙලි කොට සල ගොවිතැන හා තෝරාගත් ගස් හෙළීම (විශේෂයෙන් නිවර්තන ප්‍රදේශ වල) ස්වාභාවික ව්‍යසනයන්ට කිසිසේත් සමාන කළ නොහැකිය. මෙබඳුවූ කටයුතු වලින් අතිවිශාල ප්‍රදේශයක පැතිර පවත්නා ස්වාභාවික පරිසර පද්ධතීන්ට වන විපත් සිදුවූවාට පසුව නැවත ඒවා යථා තත්වයට පැමිණවීම කළ නොහැකි කාර්යයකි. අසීමිත ලෙස කැලෑ එළිකිරීම හේතුකොටගෙන ශ්‍රී ලංකාවේ උසස් වර්ගයේ කැලෑ දැන් ලඳු කැලෑ, තණබිම් හා වෙනත් වර්ගයේ නොවටිනා වෘක්ෂලතාදියෙන් ගහණව ඇත. ඉඩම් මෙසේ අනිසිලෙස පරිහරණය කිරීම හේතුකොටගෙන ස්වාභාවික වනාන්තර වලින් ශේෂව ඇති කොටස සංරක්ෂණය කරගැනීම අත්‍යවශ්‍ය කර්තව්‍යයක් වන බව අපගේ අවධානයට ලක්වී ඇත. වනාන්තර නැතහොත් ශේෂව පවත්නා වනාන්තර පරිසරය රැකගැනීම සඳහා ආරක්ෂා කරගැනීම හා දැව, දරගිනි ආදිය නිශ්පාදනය කිරීම සඳහාද යොදගැනීමේ ගැටළුව වන පාලකයෙකු නිරාකරණය කෙරෙනුයේ කෙසේද? ඔහු කාර්ය වැඩ සටහනක් සූදනම් කිරීමේදී ස්වාභාවික හා ආර්ථික සාධක වලින් පනවනු ලැබ ඇති සීමා ඇතුලත කටයුතු කළ යුතු බව සිහිපත් කරගත යුතුය.

ස්වාභාවික සාධක වලින් ශාක සංහතියෙහි වර්ධනය හා ප්‍රතිජනනය නිර්ණය කෙරෙන අතර, වන පාලකයා ඔහුගේ වන විද්‍යාත්මක කටයුතු සැලසුම් කල හැක්කේ කවර මූල්‍ය සීමාවන් ඇතුලත ද යන්න නිර්ණය කරනු ලබන්නේ ආර්ථික සාධක මගිනි.

## වත්මන් හා අනාගත උපක්‍රම :

වන සංරක්ෂණය යනුවෙන් කැලෑ සම්පූර්ණයෙන් ආරක්ෂා කර ගැනීමක් (ඉතාමත් සීමිත ප්‍රදේශයක හැර) අදහස් නොකරමු. සංරක්ෂණය යනුවෙන් සම්පූර්ණ ආරක්ෂාව සැලසුම අදහස් විනි නම්, එය අතිශයින්ම නිසරු සංකල්පයක් වනු පමණක් නොව, වෘත්තීය වශයෙන් වන විද්‍යාවට තැනක් නොලැබෙන අතර, වන පාලක යෙකුගේ රාජකාරිය හුදෙක් කැලෑ ආරක්ෂා කිරීම පමණක් වනු ඇත. සමාජයට ප්‍රශස්ථවූ හා චිරකාලීන ප්‍රතිලාභ අත්පත්වන අයුරින් කැලෑ පාලනය කිරීම වන විද්‍යාවේ සාරය වේ. වන විද්‍යාවේ විවිධාංගයන්හි (රුක් වගාව, පරිහරණය, කැලෑ ආරක්ෂාව, පාංශු විද්‍යාව හා වන ආර්ථික විද්‍යාව ආදිය) පුහුණුව ලත් වන පාලකයා පරිසර රක්ෂණය හා දැව නිශ්පාදනය යන කර්තව්‍ය මගින් සමාජයට ප්‍රශස්ථ ප්‍රතිලාභ ලබාදිය යුතුය.

ශ්‍රී ලංකාවේ වන සංරක්ෂණය හා සංවර්ධනය පිළිබඳව වන පාලකයා අනුගමනය කළයුතු පෘථුල උපක්‍රම කවරේද? දිවයිනේ දේශගුණික කලාප තුනක් අපි මුලදී සඳහන් කළෙමු. වැඩි වශයෙන්ම; උස්වූ හා ලඟාවිය නොහැකි බිම් පෙදෙස්හි පිහිටියා වූද අක්කර 250,000 ක පමණ වූ විකීර්ණ ස්වාභාවික වනාන්තර තෙත් කලාපීය පහත් රට හා මැදරට පිහිටියේය. මෙම භූමි භාගය තෙත් ප්‍රදේශයෙන් අල්පවූ කොටසක් පමණක් වන බැවින්, සහ මෙම ප්‍රදේශය ජලගැල්ම හා පාංශු ඛාදනය බඳුවූ ස්වාභාවික උපද්‍රවයනට භාජන වීමට ඉඩ ඇති බැවින්ද, මෙම ශේෂව පවත්නා ස්වාභාවික වනාන්තර පරිහරණය පිණිස මුද නොහැර, එලෙසම පවත්වාගෙන යාම අවශ්‍යය. එසේ වුවද අක්කර 250,000 ක් පමණ වූ මුළු භූමිභාගයම 'ස්වාභාවික රක්ෂිත ප්‍රදේශයක්' ලෙස වෙන් කළයුතු යයි මින් අදහස් නොකෙරේ. අප රටෙහි අවශ්‍යතාවයන් අනුව එය සිදු කළ නොහැක්කකි. මූළුමනින්ම ආරක්ෂිත ප්‍රදේශ ලෙස වෙන්කළ ප්‍රදේශ හැරුනුවිට සෙසු කොටස්වල සීමාසහිතව ගස් කැපීම සඳහා ඉඩදිය යුතුය. තෙත් කලාපීය ස්වාභාවික වනාන්තරවල දැව නිශ්පාදන ක්‍රමය අනුව, ප්‍රමාණය (ගස මුහුකුරා ඇති බව දැනගැනීමට) සහ උපයෝගිතා අගය අනුව වෙන් වෙන් වශයෙන් තෝරාගත් ගස් පමණක් කපාගනු ලැබේ. මෙම ක්‍රමය අනුව අක්කරයකින් ගස් 2 හෝ 3 කට වැඩිය නොකපනු ලැබේ. තත්වයෙන් බාල වර්ගයේ ඒවා නොව වඩා උසස් වර්ග වල ගස් රෝපනය කිරීම සඳහා යෝග්‍ය රුක් වගා ව්‍යාපාරයක්ද ක්‍රියාත්මක කරවිය යුතුය. ඉතාමත් සාර්ථක ලෙස ස්විට්සර්ලන්තයේ අනුගමනය කරනු ලබන මෙම ක්‍රමය ක්‍රියාත්මක කරවුවහොත් කිසිවිටකදී වනාන්තර පාලු නොවනු ඇත.

ශ්‍රී ලංකාවේ ස්වාභාවික වනාන්තරවල විශේෂයෙන්ම තෙත් කලාපීය වනාන්තරවල ලොව අන් කිසිදු රටක දක්නට නොලැබෙන මෙරටට ආවේනික වූ ශාක වර්ග ගණනාවක්ම ඇති අතර, වන විද්‍යාත්මක කටයුතු වලින් එබඳු ශාක වර්ග වල පැවැත්ම කෙරෙහි තර්ජනයක් ඇති නොවිය යුතුය. එබැවින් ඇතැම් ස්වාභාවික වනාන්තර ප්‍රදේශවල (සිංහරාජ අඩවියෙන් සැලකිය යුතු කොටසක් ඇතුළුව) කවර අන්දමක මනුෂ්‍ය කටයුතු සඳහා වුවද අවසර නොමැතිව මුළුමනින් ආරක්ෂිත ප්‍රදේශ වශයෙන් වෙන් කොට ඇත.

එක් අවධියක වනාන්තර වලින් ගැවසී දැනට තණ, පර්ණාංග හා ලඳු කැලෑ වලින් හෙබි අක්කර 200,000 ක් පමණ වූ අත්හල ප්‍රදේශද තැනින් තැන විසිර පවතී. මේවා තිර පදනමක කෘෂිකර්මය සඳහා යෝග්‍ය නොවන අතර, තැනින් තැන ගොනුන් විසින් උලා කෑම සහ කුඩා බිම් කට්ටි වල මයියොක්කා වගාවද හැරුනු කළ නිශ්පාදකතාවයෙන් තොරව පවතී. මෙම ප්‍රදේශ වලින් වැඩි කොටසක් වන සංවර්ධනය උදෙසා යොදගත හැකි වන අතර, ප්‍රධාන වශයෙන් පයිනස් කැරිබියා ගස් රෝපනය කිරීම ඇතුළු ප්‍රතිරෝපණ ව්‍යාපාරයක් දැනට මෙහි ක්‍රියාත්මක කරවනු ලැබේ. ප්‍රධාන වශයෙන් **පයිනස් වර්ගයේ** ගස් වගා කරනුයේ කඩදසි කර්මාන්තය සඳහාය. පයිනස් හා මෙරට ප්‍රතිරෝපණය සඳහා යොදගනු ලබන තේක්ක ආදීවූ වෙනත් ගස් වර්ග ද දේශීය ඒවා නොවේ. ප්‍රතිරෝපණය සඳහා දේශීය ගස් වර්ග නොව විදේශීය ගස් වර්ග තෝරා ගැනීම සඳහා වන පාලකයාට බොහෝ විට චෝදනා නගනු ලැබේ. නමුත් ප්‍රශ්නය අනිකකි, දේශීය කැලෑ ගස් වර්ග ස්වාභාවික වනාන්තරවල මහේශාක්‍ය ලීලාවෙන් වැඩී පවත්නා බැවින්, මෙසේ මනාව දේශීය තත්වයනට අනුරූප දේශීය වර්ගයනට වඩා වෙනත් විදේශීය ගස් වර්ග තෝරාගනු ලබන්නේ කුමක් නිසාද? මෙම පැනයට මෙහිදී ලුහුඬින් පිළිතුරු සැපයෙන අතර කතුවරයා වෙනත් ලිපියක් මගින් වඩාත් සවිස්තරව කරුණු පැහැදිලි කර ඇත.*

අවුරුදු දහස් ගණනක් ඔස්සේ වර්ධනයව පැවති නිවර්තන වර්ෂා වනාන්තර අනර්ඝ වූ හා සංකීර්ණවූ පරිසර පද්ධතියකින් යුතුවන අතරම, ඉතාමත් සියුම් ලෙස සංතුලනය වූ පද්ධතියක්ද වන බව බොහෝ විට පිළිගනු නොලැබේ. ශ්‍රී ලංකාවේ තෙත් කලාපය බඳුවූ පාංශු ප්‍රදේශ වල පස නිතැතින් ශාක පෝෂ්‍යදයී පදර්ථයෙන් හීනවේ. එබැවින් වනාන්තරය පෝෂණය වනුයේ, ශාක හා සත්ව ද්‍රව්‍ය විනාශවීමේදී පස උරාගන්නා ශාක පෝෂ්‍යදයී පදර්ථ සීඝ්‍රයෙන් අවශෝෂණය කරගැනීමෙනි. මෙවන් වනයක් එළිපෙහෙලි කොට හේන් ගොවිතැනට යට කලහොත්, හේන් ගිනිබත් කිරීමෙන් ලැබෙන පෝෂ්‍යදයි පදර්ථ අවුරුදු දෙකකින් පමණ පසට නොලැබී යනු ඇත. මෙයාකාරයෙන් නිසරුවූ මුඩු බිම් වල උසස් වර්ගයේ කැලෑ ගස් රෝපණය කල නොහේ. එබැවින්, එබඳු නිසරුවූ බිම්වල ප්‍රතිවනරෝපණය සඳහා යොදගත යුතු වනුයේ අවක්‍රමණීත තත්වයනට ඔරොත්තු දෙන රුක්ලතා වර්ගයන්ය. නිවර්තනික ප්‍රදේශ වල බහුලව වගා කරන පයිනස් කැරිබියා එබඳු ගස් වර්ගයකි. පාරිසරික හා සෞන්දර්යාත්මක මත අනුව, ස්වාභාවික වන එලෙසින්ම පවත්වාගෙන යාම වඩා මනාප වුවද වනාන්තර විනාශ කරනු ලැබුවාට පසුව, ඒවා නිසරු මුඩුබිම් ලෙස පැවැත්මට ඉඩ හැරීමට වඩා අනුහුරුතාවයෙන් යුතු රුක්ලතා වර්ග රෝපණය කිරීම ඥාණාන්විතය.

වියළි කලාපය දෙස අවධානය යොමු කිරීමේදී, මෙය අනාගතයේදී කෘෂිකාර්මික හා වන විද්‍යාත්මක වශයෙන් උපරිම සංවර්ධනයට යටත් වන බව පෙනී යයි. වියළි කලාපයේ වනාන්තර හා ලඳු කැලෑ ප්‍රදේශ, එම මුළු බිම් ප්‍රමාණයෙන් සියයට හතළිහක් පමණ වේ යයි ගණන් බලා ඇත. මෙම ප්‍රදේශයෙන් වැඩි කොටසක් ඉදිරි දශක ඇතුලත සංවර්ධන සඳහා උපයෝගී කරගනු ලබන අතර, එවිට ස්ථිර වනාන්තර ලෙස අක්කර දශ ලක්ෂ 2 සිට 3 දක්වා ශේෂව පවතිනු ඇත. දිවයිනෙහි අනර්ඝතම දැව ගබඩාව වශයෙන් කලකදී නම් දූරු වියලි කලාපීය ස්වාභාවික වනාන්තර වලින් අපගේ අවශ්‍යතාවයන්ගෙන් අංශුමාත්‍රයක් පමණක් සපුරාලීමට දැන් ප්‍රමාණවත් වන බව එක්දහස් නවසීය පණස් ගණන් සිටම පෙනීගිය කරුණකි. එබැවින් ඉතා කුඩා පරිමාණයකින් කරගෙන ගිය ලැබූ වන රෝපණ කර්තව්‍ය ව්‍යාප්ත කරන ලදී. දැනට වියලි කලාපයේ වන ප්‍රතිරෝපණ පරිමාණය, අවුරුද්දකට අක්කර 15,000 සිට 20,000 දක්වා වේ. මෙම බිම් ප්‍රමාණයෙන් තුනෙන් දෙකක පමණ තේක්ක වගා කර ඇත. අනාගතයේදී ප්‍රතිරෝපණය සඳහා තේක්ක යොද ගැනීම නියත වශයෙන්ම වැඩි කරනු ලබන අතර, අක්කර 160,000 කින් පමණ සමන්විත තේක්ක වතුයාය ඉදිරි දශක කිහිපය තුලදී තවත් ව්‍යාප්ත කරනු ලැබේ. (අලි ඇතුන් විසින් තේක්ක වගාවන් විනාශ කිරීම තාවකාලික ගැටළුවක්ව පවතී) එබඳු වතු යාය වලින් ලැබෙන නිශ්පාදන බොහෝ සේ ප්‍රමාණවත් වේ යයි සලකනු ලැබේ. 1978 සුළි සුළඟෙන් හානිපත් ප්‍රශස්ථ ප්‍රමාණයට වඩා බාලවූ තේක්ක ගස් විශාල තොගයක් වෙළඳ පොලට පිවිස ඇති අතර, බලාපොරොත්තු වියහැකි නිශ්පාදන තත්වය මෙයින් අනුමාන කළ හැක.

* විජේසිංහ එල්. සී. ඒ. ද එස්. (1978) වන රෝපණය සඳහා විදේශීය තුරුලතා වර්ග තෝරා ගන්නේ ඇයි? එකොනමික් රිව්ව 4:2–3

වියළි කලාපයේ වන ප්‍රතිරෝපණ කර්තව්‍යයෙහි යෙදී සිටින අතරම, ප්‍රදේශයේ ප්‍රමාණවත් ස්වාභාවික වනාන්තරවල පැවැත්ම කෙරෙහිද අවධානය යොමු කළ යුතුය. නිසැකයෙන්ම පස සහ ජලය සංරක්ෂණය හා පරිසරය ස්ථායිකරණයෙහිලා මෙම ස්වාභාවික වනාන්තර වැවිලි වගාවන්ට වඩා කාර්යක්ෂම වේ. එමෙන්ම දේශීය ප්‍රවේණ්‍යානු සංශදය සුරැකීම සඳහාද ස්වාභාවික වනාන්තරවල පැවැත්ම අවශ්‍ය වේ. වියළි කලාපයේ ජාතික වනෝද්‍යාන ඇතුළුව අක්කර දශ ලක්ෂ 1.5 සිට 2 දක්වා ප්‍රමාණයක ස්වාභාවික වනාන්තර එපරිද්දෙන්ම තිබෙන්ට ඉඩහරිනු ලැබේ යයි අපේක්ෂිතය.

එබැවින් කඳුකරයේ වනාන්තර පරිසරය සුරැකීම සඳහා එපරිද්දෙන්ම පවත්වා ගැනීම වඩා නුවණට හුරුය. එසේ වුවද ප්‍රදේශයේ දරගිනි අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා සීමිත බිම් ප්‍රදේශවල ගස් කපා හෙළීම කලයුතුවන අතර, එබඳු ප්‍රදේශවල දරගිනි වැඩි වශයෙන් ලබාගත හැකි වර්ග වල ගස් රෝපණය කරනු ලැබේ. කඳුකරයෙහි ස්වාභාවික වනපෙත් හැරුණුවිට, උඩරට හා මැදරට වෙනත් ප්‍රදේශවල සංවර්ධන වන විද්‍යාත්මක කටයුතු උදෙසා ප්‍රමාණවත් ඉඩකඩ ඇත. කඳුකර තණබිම් හෝ පතන්වල දේශීය ගස්වර්ග දක්නට නොමැති අතර, මේවා පයින්ස් හා ඉයුකැලිප්ටස් වර්ගයේ ගස් රෝපණය සඳහා ඉතා යෝග්‍ය වේ. පතන්හි පවත්වාගෙන යනු ලබන වැවිලි වලින් (දැව, දරගිණි හා පල්ප දැව ආදී වශයෙන්) අධි නිශ්පාදකතාවයක් ලබාගත හැකි වන අතර ඒවා පතන් බිම් වල ආරක්ෂක තීරු වශයෙන්ද ප්‍රයෝජනවත් වේ. පතන් හැරුණු විට අත්හල සහ නිශ්පාදකතාවයෙන් තොර වූ තේ වගාවන් ද ඇත. මේවාද දැඩි විභවතාවයෙන් යුතු වැවිලි වගාවන්ට පරිවර්තනය කරනු ලබමින් පවතියි.

වර්තමාන වන ප්‍රතිරෝපණ වැඩසටහන සැලසුම් කරනු ලැබූ අවධියේදී ප්‍රමාණවත් ලෙස සලකනු ලැබුව වුවද අද එය ව්‍යාප්ත කළ යුතුව ඇත. අතීතයේදී ජාතික වන ප්‍රතිරෝපණ සැලසුම් කර්තව්‍යයෙහිදී අල්ප අවධානයට ලක්වූ එක් ක්ෂේත්‍රයකි, දරගිනි සැපයුම පිළිබඳ ප්‍රශ්නය. ගෙවල් 90% ක පමණ හා තේ, පාන්, ගඩොල්, උළු, දුම්කොළ ආදී කර්මාන්ත සඳහාද බොහෝ සෙයින් දරගිනි පාවිච්චියට ගනු ලැබුව වුවද, මෙම ප්‍රශ්නයට එතරම් වැදගත් තැනක් නොලැබී ඇත්තේ, රජයේ කැලෑ වලින් සංවිහිත අන්දමකින් සපයනු ලබන දරගිනි ප්‍රමාණය අවශ්‍යතාවයෙන් අංශු මාත්‍රයක් පමණක් වන බැවිනි. ප්‍රතිරෝපනය කරනු ලබන රබර් වතු වලින් රබර් දර, පුද්ගලික ඉඩම් වලින්කපා හෙළූ ගස්, කෘෂිකාර්මික පර්යේෂණ සහ රජයේ කැලෑ වලින් ලබා ගන්නා දර වලින්ද අවශ්‍යතාවයන් පිරිමසා ගනු ලැබේ. මෑතකදී යම් සාධක දෙකක් මගින් දරගිනි සැපයුම් පිළිබඳ ප්‍රශ්නය කෙරෙහි අවධානය යොමු කරවන ලදී. ලෝක ඉන්ධන අර්බුදය මින් එකක්වන අතර, පෘථුල පරිමාණයකින් දරගිනි වලින් ඉන්ධන වලට මාරු වීමකට ඇති ඉඩකඩ ශ්‍රී ලංකාව විසින් අතහැර ඇත. ස්වාභාවික වනාන්තර සීඝ්‍රයෙන් කපා හෙළීම හා මහවැලි ව්‍යාපෘතිය හා සම්බන්ධී මහපරිමාණ ජනාවාස ඉදිකිරීම් සහේතුක අනිකුත් සාධක වන අතර දරගිනි සැපයුම් පිළිබඳ ප්‍රශ්නයක් උද්ගත නොවූ ප්‍රදේශය සංවිධානාත්මක ලෙස දරගිනි සම්පත් ගොඩනැංවිය යුතුව ඇත. දරගිනි නිශ්පාදනය සඳහා ජාතික වන රෝපණ වැඩසටහනක් දියත් කිරීම වැදගත් අවශ්‍යතාවක් බවට පත්ව ඇති අතර, අදාල අධිකාරීහු උසස් ප්‍රමුඛත්ව පදනමකින් මේ පිළිබඳව කටයුතු කරති.

**පරිසමාප්තිය** :

මහජනතාව විසින්ද අවබෝධයෙන් යුතුව, ජාතික සංවර්ධනයෙහි ලා වන විද්‍යාවේ කාර්යභාරය නිවැරදිව වටහා ගත යුතුය. මෙය වඩාත් වැදගත් වනුයේ කෘෂිකර්මාන්තය පිළිබඳව මෙන් නොව නැණවත් වන විද්‍යාත්මක කටයුතු වලින් සමාජය භුක්ති විඳින ප්‍රතිලාභ මුළුමනින්ම වටහා ගැනීම අසීරු කාර්යයක් වන බැවිනි. වන විද්‍යාවෙහි සංරක්ෂණය හා සංවර්ධනය පිළිබඳ උපමානයන් හා උපක්‍රම මා ලුහුඬින් විස්තර කර ඇත්තේ එබඳු ආකල්පයක් පෙරදැරි කොට ගෙනය.